ET/SSS/2022(2023)/OL/21/S/Q/S-2

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)


# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Sinhala Language and Literature

# සිංහල භාෂාව හා සාහිත්‍යය



**Question Paper - I, II, III | ප්‍රශ්න පත්‍රය - I, II, III (සිංහල මාධ්‍යය)**

Nenasa

The National e-learning Portal for The General Education

දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 21 | S | I |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II,III**
**சிங்களமொழியும் இலக்கியமும் , II,III**
**Sinhala Language and Literature I, II,III**

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I**

**සැලකිය යුතුයි:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. සුළු වරදකටත් **ඇඟට ගොඩ වෙන** මිනිස්සු අද සමාජයේ බහුල ය.
   (1) සමාව අයදින (2) අතින් පයින් පහර දෙන
   (3) ආරවුලට පැටලෙන (4) කෝපයට පත් වන

2. පුතු හා බිරිඳ **කුකුළා අතින් අරගෙන ම** තමන්ගේ දුක සැප බැලීමට ඒම ගැන මවුපියෝ සතුටට පත් වූහ.
   (1) ඉතා පාන්දරින් (2) කෑම ද රැගෙන
   (3) අඩ අඳුරේ (4) කුකුළන් හඬලද්දී

3. **හය හතර නොදන්නා** දරුවන් විවිධ අකටයුතුකම්වලට යොදා ගැනීම අපරාධයකි.
   (1) පින් පව් නොහඳුනන (2) ළදරු වියේ සිටින
   (3) ඉලක්කම් කියවිය නොහැකි (4) හොඳ නරක නොදත්

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. වේදිකාවට බට තරුණ ගායකයා .................. කුල්මත් කරමින් ගීත කීපයක් ම ගැයී ය.
   (1) පාඨකයන් (2) ශ්‍රාවකයන්
   (3) ප්‍රේක්ෂකයන් (4) නරඹන්නන්

5. අද වන විට අපේ රටේ ආනයනික ආහාර ................ බෙහෙවින් අවම මට්ටමක පවතී.
   (1) පරිභෝජනය (2) පරිහරණය
   (3) පරිශීලනය (4) පරිභාවිතය

6. පවත්නා ආර්ථික උද්ධමනය හමුවේ ජීවත් වීමට මාසික .............. ප්‍රමාණවත් නොවන බවට බොහෝ දෙනා මැසිවිලි නගති.
(1) ආදායම (2) දීමනාව
(3) වේතනය (4) මුදල

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදුණු පද පේළිය තෝරන්න.
(1) ආභාෂය, අත්‍යවශ්‍ය, කෘතිම, දෘෂ්‍යාබාධිත
(2) ලේඛණාගාරය, පිළිසඳර, වලාකුළ, සණ්ඨාරය
(3) පුපුරන, සංලක්ෂන, කනගාටුව, කුරුළු රෑන
(4) ප්‍රශ්වාස, බල තෘෂ්ණාව, විස්මයාවහ, ගැටලු.

8. එක් එක් පේළියේ ඇති වචනවල දෙවන අකුර හා පිළිවෙළින් බැඳී ඇති ගැටපිල්ල, රේඵය, රකාරාංශය හා යංශය සහිත පද පේළිය තෝරන්න.
(1) විස්තෘත, මිශ්‍රණය, වර්‍ගමූලය, කාව්‍යාත්මක
(2) පිතෘ ස්නේහය, වර්තමාන, මුද්‍රණය, උද්‍යෝගය
(3) ධර්මෝපදේශ, ස්මෘතිය, චක්‍රබද්ධ, සම්‍යක්ප්‍රයෝග
(4) පෘථග්ජන, මාර්ගෝපදේශ, මනුෂ්‍යයෝ, විප්‍රයෝගය

9. දන්තජ හා තාලුජ අක්ෂර පමණක් ඇතුළත් වචනය තෝරන්න.
(1) මුරපද (2) ගහරළ
(3) ඡන්දය (4) නිශ්චල

10. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) බකමූණා, බළලා, මයිනා, මොනරා
(2) ගවයා, ඌරා, උකුස්සා, ජිරාෆ්
(3) කැස්බෑවා, කුකුළා, නරියා, ඔටුවා
(4) අශ්වයා, කැන්ගරුවා, රිළවා, බූරුවා

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) මාගමක, රීතීන්, ඔවුන්, සුරඟනක
(2) උපාසිකාවෝ, මිනිසුන්, භික්ෂූහු, ගවයා
(3) වාර්තාකරුවෙකු, දෙවියකු, විදුහල්පතිවරු, නිලධාරින්
(4) ශිෂ්‍යාවක්, ක්‍රීඩිකාවන්, රියැදුරන්, ළමයි

12. "බිත්තියෙහි රඳවා තිබූ සිතුවම දුටුවන් නෙත් පැහැර ගති." යන වාක්‍යයෙහි 'බිත්තියෙහි' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) කරණ (2) සම්බන්ධ
(3) ආධාර (4) අවධි

13. 'කිරිපැණි' යන්න අයත් වන්නේ,
(1) විශේෂණ සමාසයට ය. (2) දකාරාර්ථ සමාසයට ය.
(3) විභක්ති සමාසයට ය. (4) අන්‍යාර්ථ සමාසයට ය.

14. ප්‍රසංග + ඉක යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) ප්‍රාසංගික (2) ප්‍රසාංගික
(3) ප්‍රාසාංගික (4) ප්‍රසංගික

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) තද්ධිත - දිගටි, ප්‍රබලතා, සදාතන, දාරුමය
(2) කෘදන්ත - නැටුම්, සැලකිලි, දවටන, බහාලුම්
(3) සර්වනාම - සියලු, දැරිය, තොප, ඒවා
(4) නිපාත - ඇයි, කැටුව, උදෙසා, එහෙත්

16. **කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) අවසාන මොහොතේ ඔහුට යථාර්ථය වැටහිණි.
(2) උවැසිය ගාථා කියමින් මල් පිදුවා ය.
(3) පොහොර ලැබුණොත් ගොවියන් සතුටු වේවි.
(4) අඳුර වැටෙද්දී අපි නිවෙසට පැමිණියෙමු.

- **17** සිට **19** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. අවසාන තරගය ජය ගත් ක්‍රීඩකයන්ගේ **අමන්දානන්දය** ඔවුන්ගේ මුහුණුවලින් කියා පෑවේය.
(1) මඳ සිනහව (2) නොමඳ සතුට
(3) සැඟවුණු ප්‍රීතිය (4) විශේෂ ප්‍රහර්ෂය

18. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයෝ නාට්‍ය කලාවෙන් ලංකා දේශසීමාව **අතික්‍රමණය** කළ සාහිත්‍යධරයෙක් වූහ.
(1) පරාජය කිරීම (2) ආක්‍රමණය
(3) ඉක්මවා යෑම (4) දික් විජය

19. පුරාණ භූපතීහු **වර්ගෝන්නතිය** පිණිස සුවිසල් මෙහෙයක් කළහ.
(1) ජාතියේ පැවැත්ම (2) ජාතියේ දියුණුව
(3) ජාතික සංහිඳියාව (4) ජාතියේ ව්‍යාප්තිය

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) පිඟාන, අත්පිස්නාව, දූරකථනය, වතුර
(2) කුල්ල, පෙනේරය, වංගෙඩිය, ලිප
(3) වළල්ල, මුද්ද, කරාබුව, මාලය
(4) කොළ, මල්, පොතු, දලු

21. එක් එක් පද පේළියේ දක්වා ඇති සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | හරසර - බුහුමන් | ටැඹ - කුලුණ | සරතැස - සතුට | ස්නිග්ධ - සිනිඳු |
| (2) | කුඩා - ක්ෂුද්‍ර | දියුණුව - ප්‍රගතිය | සතුරු - පිළිමල් | වචන - තෙපුල් |
| (3) | අශ්වයා - හය | නුවණ - ඇස | මුහුණ - වක්ත්‍ර | ධවල - ශ්වේත |
| (4) | දක්ෂ - හොඳ | පොළොව - මිහි | හිරු - දිනිඳු | ඇතා - නාග |

22. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) මැණික් - රුවන්, මිණි, මාණික්‍ය, රත්න
(2) විපත - පිරිපත, ආපදාව, ව්‍යසනය, අවුල
(3) කුරුලු - විහඟ, සියොත්, දද, පක්ෂි
(4) වෘක්ෂය - රුක, ද්‍රැමය, තුරු, පාදප

23. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) සක්‍රිය - නිෂ්ක්‍රිය (2) ප්‍රත්‍යක්ෂ - අනුමාන
(3) අදාන්ත - දුර්දාන්ත (4) අල්ප - අනල්ප

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) විභක්ති සමාසය සඳහා ආලපන විභක්තිය නොගැනේ.
(2) 'ඔහු' යන්න උක්ත අනුක්ත රූප දෙකට ම පොදු ය.
(3) 'අපොයි' යනු භාවාර්ථ නිපාත පදයකි.
(4) උපසර්ග, වචනයක මුල හා අග ද යෙදේ.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) විචාරශීලී චින්තනය වැදගත් වන්නේ පාසල් අධ්‍යාපනය නිමාවීමෙන් පසුව ය.
(2) මිනිසුන් පමණක් නොව සත්තු ද වසංගත රෝගවලට ගොදුරු වන්නාහ.
(3) ගුරුවරුන්ගේ අවශ්‍යතා අනුව නව අධ්‍යාපන වෙනස්වීම් සරු කෙරේ.
(4) අපේ රජවරුන් ඉදි කළ වැව් ජලය පානීය අවශ්‍යතා සඳහා පමණක් යොදා ගැනිණ.

- අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. බලාපොරොත්තු වූ දෙයක් අනායාසයෙන් ඉටුවීම.
(1) අම්බලම කැඩුණට ගව්ව කොට වේද
(2) බළලුන් ලවා කොස් ඇට බාවන්නා සේ
(3) ඉබ්බා දියේ දැම්මා වගේ
(4) අන්දරේ සීනි කෑවා වාගේ

27. නිෂ්ඵල කාර්යයක යෙදීම
(1) ගමරාල දිව්‍යලෝකෙ ගියා වගේ
(2) එළහරකයි මීහරකයි එකට ඇඳුවා වගේ
(3) තණකොළ කපන්න කිතුල්ගහට ගියා වගේ
(4) අහසට ඉණි මං බැන්දා වගේ

28. කම්මුල, තම්පලා යන සන්ධි පද අයත් සන්ධි විධි පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) පරරූප සන්ධිය හා ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය
(2) ආගම සන්ධිය හා පූර්වරූප සන්ධිය
(3) පරරූප සන්ධිය හා ගාත්‍රාදේශ සන්ධිය
(4) ගාත්‍රාදේශ සන්ධිය හා ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය

- අංක **29, 30** යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) මා එම පොත කියවා ඇත්තෙමි.
(2) පරාක්‍රමබාහු රජතුමා දක්ෂ පාලකයකු විය.
(3) ළමයින් විසින් චිත්‍ර අඳිනු ලැබේ.
(4) අපි නිවැරදි ව්‍යාකරණ රීති අනුගමනය කළ යුතු ය.

30. (1) අපි සත්‍යගරුක පුරවැසියන් වෙමු.
(2) දරුවෝ දෙමවුපියන්ගේ අපේක්ෂා ඉටු කරාවි.
(3) ඕ තොමෝ ගමට යන්නේ ය.
(4) මිනිසුන් අවංක නොවන්නේ ඇයි?

31. ★ ශ්‍රී ලංකාවේ අගනුවර ............ ශ්‍රී ජයවර්ධනපුරය ඓතිහාසික වැදගත්කමින් යුක්ත නගරයකි.

★ සභාපතිවරයා .......... අධ්‍යක්ෂවරයා ඇගයීම් මණ්ඩලයේ ප්‍රධානත්වය දැරී ය.

★ විභාග ප්‍රතිඵල එන ............. අපි නොඉවසිල්ලෙන් සිටියෙමු.

★ සඳුදා සිට සිකුරාදා ........... රජයේ කාර්යාල විවෘත ව පවතී.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) නොහොත්, හෙවත්, තෙක්, තුරු
(2) හෙවත්, නොහොත්, තෙක්, තුරු
(3) හෙවත්, නොහොත්, තුරු, තෙක්
(4) නොහොත්, හෙවත්, තුරු, තෙක්

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

" මම එයාව හොඳට දන්නවා"

(1) මම හෙතෙම හොඳට හඳුනමි
(2) මම ඔහු ව හොඳින් හඳුනමි
(3) මම ඔහු හොඳින් හඳුනමි
(4) මා විසින් ඔහු හොඳින් හඳුනමි

33. පහත සඳහන් කවි දෙපදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දැක්වෙන වරණය තෝරන්න.

" සැඳෑ සඳුට සදමින් මග නිසා කත
ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමුත"

(1) පායා එන චන්ද්‍රයා රාත්‍රිය නම් වූ කාන්තාවට මග අලංකාර කරමින් බබළන මල් සමූහයක් විසුරුවාලූවාක් මෙන් තාරකාවෝ බබළති.
(2) රාත්‍රිය නම් කාන්තාව සැඳෑවේ පායා එන චන්ද්‍රයාට මාර්ගය සරසමින් දීප්තිමත් මල් සමූහයක් විසුරුවා හැරියාක් මෙන් තරු කැල බබළයි.
(3) රැය නැමැති කත සැඳෑ සඳුට මග සදමින් දැමූ මල් ඇතිරිල්ලක් සේ තරු රැනක් බබළන්නේ ය.
(4) නිශාකත තමා හමුවට එන්නාවූ චන්ද්‍රයාගේ මාර්ගය මල්වලින් අලංකාර කිරීමට විසුරුවා හළ කුසුම් කැන් සේ තාරකා බබළයි.

34. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

''ලොව දියුණු රටවල් ආදර්ශයට ගෙන ක්‍රමවත් ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහනක් ක්‍රියාවට නැංවිය හැකි වුවහොත් කැලි කසළ විපතක් නොව අපේ රටට මනා සම්පතක් බවට පත් කර ගැනීම අසීරු නොවේ. ''

(1) ලොව දියුණු රටවල් අනුව යැමෙන් කසළ ප්‍රතිචක්‍රීයකරණය මගින් අපේ රටට මහත් ප්‍රතිලාභ අත් කර ගත හැකි ය.
(2) ලොව දියුණු රටවලට ද ආදර්ශයක් වන පරිදි ක්‍රමවත් කසළ ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලියක් මගින් විපත සැපතක් බවට හරවා ගත හැකි ය.
(3) ලොව දියුණු රටවල් ආරම්භ කොට ඇති කැලි කසළ ප්‍රතිචක්‍රීයකරණය විධිමත් කිරීමෙන් අපේ රටේ විපත් අවම කරගෙන කැලි කසළ සම්පතක් බවට පත් කර ගත හැකි ය.
(4) ලොව දියුණු රටවල මූල්‍ය ආධාර මගින් කැලි කසළ උවදුරට විසඳුම් ලබා ගෙන රටේ ආර්ථිකය ඉහළ නැංවිය හැකි ය.

35. " ලංකාව ආකර්ෂණීය සුන්දර දිවයිනකි. එක් සෞන්දර්යාත්මක ලේඛකයකු සටහන් කළ පරිදි 'සුළඟින් පිවිසෙන්නේ සුමිහිරි සුවඳකි' මෙහි ඇත්තේ ඉතාම දුර්ලභ වටිනා වෘක්ෂයන්ගෙන් යුත් වනාන්තරයකි. මෙම දිවයිනේ අනර්ඝතම මැණික වශයෙන් සලකන්නේ දියමන්තිය යි."

ඉහත දක්වා ඇති වර්ණනාව ඇතුළත් "ලක්බිම වන සැරිය" ග්‍රන්ථයේ පරිවර්තකයා වන්නේ,
(1) මනෝ ප්‍රනාන්දු ය.
(2) ඩබ්ලියු. ඒ. අබේසිංහ ය.
(3) ඩේවිඩ් කරුණාරත්න ය.
(4) අභය හේවාවසම් ය.

36. පහත සඳහන් කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

සඳවා සුදු වැලි පිවිතුරු
බඳවා රන් දද පියකරු
සිටුවා දොර දොර රඹතුරු
තබවා පුන් කුඹු විසිතුරු

(1) කාව්‍යශේඛරය (2) ගිරා සන්දේශය
(3) මයූර සන්දේශය (4) ගුත්තිල කාව්‍යය

37. රූපකයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) සිප් සයුර (2) ජීවිතයේ ගිරි දුර්ගය
(3) සිනාමල් (4) ගංගා තරංග

38. "බලංගොඩ ආනන්ද මෛත්‍රේය හිමිපාණෝ ප්‍රතිචීන භාෂා පිළිබඳ හසළ දැනුමින් පෝෂිත වූහ." යන වාක්‍යයෙහි 'ප්‍රතිචීන' යන්නෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) අපරදිග (2) දකුණු දිග
(3) ප්‍රාචීන (4) පෙරදිග

39. දී ඇති අක්ෂර ගැළපීමෙන් සාදා ගත හැකි කොළඹ කවීන්ගේ නාමය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) මාසිංනභව (2) කරමමාකු
(3) ජකනාරාමු (4) මතිලජ්‍රේද

40. කමත් භාෂා ව්‍යවහාරයේ දී 'කූටාලම' යනු,
(1) කාටුව බේරීමට භාවිත කරන උපකරණයකි.
(2) හානිකර සතුන් එළවා දැමීම සඳහා භාවිත කරන උපකරණයකි.
(3) වී මැනීමට භාවිත කළ උපකරණයකි.
(4) රොඩු ඉවත් කිරීමට ගන්නා ලී උපකරණයකි.

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education, Sri Lanka**

| 21 | S | II |
|---|---|---|

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II,III**
**சிங்களமொழியும் இலக்கியமும் I, II,III**
**Sinhala Language and Literature I, II,III**

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සිංහල භාෂාව හා සාහිත්‍යය II**

- ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1 . (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

**(i)** පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න

(අ) තරඟ

(ආ) තරග

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

සියළු දෙනාගේ ම පැසසුමට ලක් වූ කඩුලු රකින ක්‍රීඩකයා තිලිණ ප්‍රදානෝත්සවයේ දී අපූරු ප්‍රකාශයක් කළේ ය .

(iii) පහත සඳහන් පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.

(අ) උන් + උන්

(ආ) කම් + හල

(iv) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග දෙකක් උපුටා දක්වන්න

ඉමහත් කැපවීමෙන් කටයුතු කළ ඔහු පරාජය පිළිබඳ කම්පා නොවී ය.

(v) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) ප්‍රබලතා

(ආ) නියුක්ත

(vi) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.

(අ) රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව

(ආ) බීජ වපුරන භූමි ප්‍රමාණය

(vii) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.

(අ) ගුණවර්ධන ඒ කම්ටුවෙහි කලාකරුවෙක් වශයෙන් ක්‍රියා කරයි.

(ආ) ගුරුතුමිය දරුවෝ සමග චාරිකාවක යෙදුණා ය .

(viii) පහත සඳහන් පද අයත් වන සමාස ප්‍රභේදය ලියන්න.

(අ) අක්කනගෝ

(ආ) තාරපති

(ix) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්තිය ලියන්න.

(අ) මේ **අපේ** පාසලයි.

(ආ) පාපැදිකරුවෝ **පදික වේදිකාවෙන්** ඉවත්ව යති.

(x) පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවන්න

(ආ) ප්‍රවීණයෝ විවිධ ක්‍රීඩා සඳහා නවකයින් පුහුණු කරති.

(ආ) උද්‍යානයේ ඒ මේ අත දුව ගිය සිඟිත්තෝ යෝධයා හඳුනා ගත්හ.

2 . පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන වචන **250කට නොඅඩු වන** සේ රචනාවක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනාව ලිවීම ආරම්භ කරන්න. රචනාව සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. ඔබ (ඊ) තෝරා ගන්නේ නම් ඒ යටතේ ඇති විස්තරය ආරම්භය ලෙස යොදා ගනිමින් නිර්මාණාත්මක රචනාවක් ගොඩ නගන්න.

අ) යොවුන් වියට එළැඹෙන දරු දැරියන් සඳහා ක්‍රියාත්මක විවිධ වෘත්තීයම ය පාඨමාලා මධ්‍යස්ථාන රැසක් මේ වන විට දිවයින පුරා ආරම්භ වී ඇත. නව සියවසට ගැළපෙන වෘත්තීය නිපුණයින් බිහි කරන පාඨමාලා රැසක් ද එකී මධ්‍යස්ථාන මගින් හඳුන්වා දී තිබේ . ඇතැම් පාඨමාලා සඳහා කිසිදු මුදල් අය කිරීමක් ද නැත. පුහුණුවීම් සඳහා අවශ්‍ය භෞතික සාධක ද සපයා දී තිබේ. නිසි දැනුවත් වීමක් නොමැති වීමත්, සමාජගත වී තිබෙන ඇතැම් ආකල්ප නිසාත්, බොහෝ දෙනා එකී වෘත්තීය පාඨමාලා මධ්‍යස්ථාන සමග සම්බන්ධ වන අවස්ථා විරල ය. කෙසේ හෝ එකී වෘත්තීය මධ්‍යස්ථාන හා පාඨමාලා වෙත දූ දරුවන් යොමු කිරීම අනාගත ශ්‍රම බලකාය වෘත්තීය නිපුණතාවලින් සන්නද්ධ පිරිසක් වීමට සෘජුව ම බලපානු ඇත.

ආ) වර්තමානයේ අප රටේ රථ වාහන අනතුරු දිනෙන් දින වර්ධනය වෙමින් පවතියි. මේ හේතුවෙන් අහිමි වන මිනිස් ජීවිත හා දේපළවල වටිනාකම මිනිය නොහැකි තරම් ය. මහමග රිය අනතුරු වැඩි වීමට හේතු වන කරුණු රාශියකි. ඒ අතරින් පදිකයන්ගේ මෙන් ම රියදුරන්ගේ ද විවිධ ක්‍රියාකලාප මේ සඳහා බෙහෙවින් බලපා ඇත්තේ ය. මේ ගැටලුවෙන් අත්මිදීම සඳහා සියලු දෙනා ම අවබෝධයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

ඉ) පෙර රජ දවස අප රටේ දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම රාශියක් ක්‍රියාත්මක වූ බවට ඉතිහාසය සාක්ෂ්‍ය දරයි. වර්තමානයේ ප්‍රචලිත බටහිර වෛද්‍ය විද්‍යාව පවා මවිතයට පත් කරන විවිධ විස්මිත චිකිත්සා ක්‍රම එහි ඇතුළත් වී තිබිණි . එහි දී කල්ක ,ගුළි, අරිෂ්ට,චූර්ණ ආදිය ලබා දීම වැනි අපේ වෙදකමට අදාළ ස්වාභාවික ඖෂධ ක්‍රමවේද ද රැසකි. සමස්ත ලෝකය ම සෞඛ්‍ය ගැටලුවලට මුහුණ පා ඇති මෙවන් කලෙක මෙම දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය

කළ යුතු ය. එම දේශීය වෛද්‍ය දැනුමෙන් ප්‍රයෝජන ලබා ගෙන වඩා හොඳ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට අප සැමට හැකියාව ඇත .

ඊ) එක්වර ම කඩා වැටුණු මහා වරුසාවට තෙමුණු මගේ මුළු ඇඟ ම සීතලෙන් වෙව්ලන්නට විය . තව දුරටත් වැස්සේ තෙමීම දරා ගත නුහුණු මම අසල වූ බස් නැවතුම වෙත දිව ගියෙමි. වැස්ස නිමා වන තුරු කිහිප දෙනෙකු එහි රැස්ව සිටි අතර කෙනෙකුගේ කෙඳිරිලි හඬක් මට ඇසිණි. ඒ හඬ බස් නැවතුම කොනේ වකුටුව නිදා සිටි අයෙකුගේ බව මා අවබෝධ කර ගත්තේ වැස්සට එහි සිටි කිහිප දෙනා නික්ම ගිය පසුව ය. මම හෙමින් ඔහු වෙත නැඹුරු වීමි ...

(ලකුණු 25 යි)

03. පහත දැක්වෙන පාඨ වචන 65 -75 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

පැරණි ලංකාවේ කෘෂිකාර්මික ජීවිතයේ පදනම වූ වාරිමාර්ග රටාවත් ඒ මත රඳා පැවති රජරට ශිෂ්ටාචාරයත් දහතුන්වන ශත වර්ෂයෙන් පසු පරිහානියට පත් විය. ජනතාව නිරිත දිගට සංක්‍රමණය වූ බව පැහැදිලි විය. සිංහල රාජධානිය නිරිත දිගට සංක්‍රමණය වූ පසු රටේ කෘෂිකාර්මික ආර්ථික පදනම නොවෙනස් ව පැවතිය ද විශේෂයෙන් දහහතරවන සහ පහළොස්වන සියවස්වල දී විදේශ වෙළඳාම පෙර කාලවලට වඩා වැදගත් වනු දක්නට ලැබිණි.

දහතුන්වන ශත වර්ෂයෙන් පසු වාරිමාර්ග පද්ධතියේ ක්‍රියාකාරිත්වය අකර්මණ්‍ය වීමටත් රජරටේ ශ්‍රී විභූතිය ක්ෂණික ව ඇති වී නැති වී යාමටත් හේතු කවරේ ද යන්න පිළිබඳ ව විවිධ උගතුන් විවිධ මාදිලියේ අදහස් දක්වා ඇත. දේශගුණික විපර්යාස නිසා රජරට වී ගොවිතැන අඩපණ වී යාම හේතු කොට ගෙන ජනතාව වැව් හා ඒ අවට ප්‍රදේශ අත් හැර නිරිත දිග ප්‍රදේශවලට සංක්‍රමණය වූ බව එක් පිරිසකගේ අදහසකි. එහෙත් පැරණි රජරට දේශගුණය, වර්තමාන දේශගුණයට වඩා විශාල වශයෙන් වෙනස් වූ බව දැක්වීමට කිසිම සාක්ෂ්‍යයක් නැත. අතීතයේ රජරට ගංගාවන්හි ගලා ගිය ජලයත් එම ප්‍රදේශ ලද වාර්ෂික වර්ෂාපතනයත් වර්තමානයේ ඇති තත්ත්වයට වඩා වෙනස් නොවූ බව භූගෝල විද්‍යාඥයන් වැඩි දෙනෙකුගේ මතයයි. වර්තමානයේ තෙත් සහ වියළි කලාප වෙන් කරන සීමාව අතීතයේත් ඒ අයුරින් පැවතිණි. පැරණි වාරි කර්මාන්ත සියල්ලක් ම පාහේ හමු වී ඇත්තේ වර්තමාන වියළි කලාපයේ ය. එහෙයින් දේශගුණික විපර්යාස නිසා දහතුන්වන ශත වර්ෂයේ මැද භාගයෙන් පසු රජරට ආර්ථික සංවිධානය සහ සභ්‍යත්වය බිඳ වැටුණේ ය යන මතය පිළිගත නොහැකි ය.

(ලකුණු 10 යි)

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

සිංහල භාෂාව ද ඉන්දු ආර්ය ගණයෙහි ලා සැලකෙන හෙයින් එහි ප්‍රභවය විජයාදින්ගේ අවධියට ගෙන යාම සාධාරණ වුව ද විජයාවතරණයට පෙර මෙහි වූවන් කිසියම් භාෂාවක් භාවිත කළ බව පිළිගන්නට සිදු වෙයි. එහෙත් ඒ පිළිබඳ සාධක කිසිවක් විද්‍යමාන නොවන හෙයින් සිංහල භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය අවධියෙහි ලා සලකන්නට වැඩිදෙනෙක් කැමති වෙති. මේ පිළිබඳ පොදු මතය ලෙස සම්භාවනා ලබන්නේ මධ්‍ය ඉන්දු ආර්ය අවදියෙහි උත්තර භාරතයෙන් මෙන් ම දක්ෂිණ භාරතයෙන් ද මේ දිවයිනට සංක්‍රමණය වූ විවිධ ජනකොටස් මෙහි ගෙන ආ මාගධී, බරෝෂ්ටි, වෛදික ආදි ප්‍රාකෘත උපභාෂා දේශීය උපභාෂා සමග මිශ්‍ර වීමෙන් සිංහල භාෂාව ප්‍රභවය වූ බව

සැලකීම වඩාත් තර්කගෝචර ය. ඒ කෙසේ වුව ද එසේ සංක්‍රමණය වූවන්ගේ භාෂාව දේශීය භාෂාවෙන් කැල ම වෙනස් නොවූ බව අවධාරණය කළ යුත්තකි.

ක්‍රි.ව සවන සියවසේ දී මෙහි පැමිණි විජය ඇතුළු හත්සියයක් පිරිසට එවක මෙහි විසූ කුවේණිය ඇතුළු යක්ෂ ගෝත්‍රිකයන්ගේ භාෂාව තේරුම් ගත හැකි වූ බව පෙනී යයි. විජයත් කුවේණියත් අදහස් හුවමාරු කර ගත්තේ ඔවුනොවුන්ගේ භාෂාවලිනි. ඒවායෙහි එතරම් ම පරතරයක් නොවූ බව පැහැදිලි ය. ක්‍රි.පූ තුන්වන සියවසෙහි මෙහි පැමිණි මහින්ද මාහිමිපාණන් ප්‍රමුඛ ධර්මදූතයන් වහන්සේලා කළ දෙසුම් මෙහි වූ දේශවාසීන්ට තේරුම් ගත හැකි විය. "සමාණාමයං මහා රාජ- ජම්බුදීපස්ස ...." ආදි වශයෙන් තමන් හඳුන්වා දීම සඳහා මිහිඳු මාහිමියන් යොදා ගත් වචන මෙන් ම උන්වහන්සේගේ අඹ පැනයට දේවානම්පියතිස්ස මහරජතුමා මිහිඳු මාහිමියනට වැටහෙන බසින් පිළිතුරු දුන්නේ ය.

මිහිඳු මාහිමියන් මෙහි ගෙන ආ භාෂාව මාගධී ප්‍රාකෘතය යි. අක්ෂර, අශෝකාක්ෂර හෙවත් බ්‍රාහ්මී අක්ෂර මාලාව යි. බුදුදහම ප්‍රවාහනය කොට ගත් එය ඉතා ඉක්මනින් දේශීය භාෂාව හා සම්මිශ්‍රණය විය .

(i) ඡේදයේ දැක්වෙන පරිදි ප්‍රාකෘත උප භාෂා දෙකක් දක්වන්න.

(ii) සිංහල භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය අවධියෙහි ලා සලකන්නට වැඩි දෙනෙකු කැමති වන්නේ ඇයි ?

(iii) දිවයිනට සංක්‍රමණය වූවන්ගේ භාෂාවත් , දේශීය භාෂාවත් බොහෝ දුරට සමාන බව අවධාරණය වන සිදුවීමක් දක්වන්න.

(iv) මිහිඳු මාහිමියන් මෙරටට ගෙන ආ අක්ෂර හැඳින්වෙන්නේ කවර නමකින් ද ?

(v) සිංහල භාෂාවේ ප්‍රභවය පිළිබඳ ලේඛකයා ඉදිරිපත් කරන අදහස කුමක්ද ?

(ලකුණු 02 X 05 = 10 යි)

5. අරුණෝදය මහා විද්‍යාලයීය කෘෂිකර්ම සංගමයේ කාරක සභා රැස්වීමක දී ඇති වූ කථාබහකින් කොටසක් පහත දැක්වේ. එය ඇසුරු කොට ගෙන දරුවන් හා දෙමාපියන් අතරේ බෙදා හැරීම සඳහා එම සංගමයේ ලේකම් සඳරු අමරසේකර ඔබ යැයි සිතා අත්පත්‍රිකාවක් සකස් කරන්න.

- පාසලේ දූ දරුවන් ගුරුභවතුන් හා දෙමාපියන් සියලු දෙනා ම ඒකරාශී කර ගෙන ගෙවතු වගා තරගයක් සංවිධානය කිරීම ගැන සාකච්ඡා කරන්නයි අද අපි රැස් වුණේ.
- මීටර් 20 X 20 බිම් කට්ටිය බැගින් වගා කිරීමට සුදුසු බිමක් හැම පන්තියකට ම ලබා දෙමු.
- බඳුන්ගත වගාව සඳහා ද අවස්ථාව ලබා දිය හැකි ය.
- අල වර්ග , එළවළු හා පලා වර්ග එක ම වගා භූමියේ වෙන් වෙන් ව වගා කිරීමට ඉඩ ලබා දෙමු.
- අඩු වියදමකින් වැඩි අස්වැන්නක් ලබා දෙන වගා බිම් ගැන විනිශ්චයේ දී වැඩි අවධානයක් යොමු කරමු.
- තරග විනිශ්චය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහාය ලබා ගන්න පුළුවන්.

- තරගය පැවැත්වෙන කාලසීමාව මාස හතරකට සීමා කරමු. එක ම දිනක වගා බිම් සකස් කිරීම ආරම්භ කිරීම හොඳයි.
- ඒ සඳහා දෙමාපිය සහාය ලබා ගනිමු. අවශ්‍ය උපකරණ රැගෙන එන ලෙස දන්වමු.
- වගාව පිළිබඳ තත්ත්ව වාර්තා තබා ගැනීමට උපදෙස් ලබා දෙන්නත් ඕන. විනිශ්චයේ දී එය නිර්ණායකයක් කර ගනිමු.
- පළවෙනි ,දෙවෙනි, තුන්වෙනි ස්ථාන ලබා ගන්නා වගාබිම් සඳහා රුපියල් 25000 ,15000, 10000 ත්‍යාග මුදල් ලබා දෙනවා.

**නැතහොත්**

පහත දක්වා ඇත්තේ කිසියම් වෙළෙඳ ව්‍යාපාරයක් පිළිබඳ කෙටි විස්තරයකි. එහි හිමිකරු ඔබ යැයි සිතා පුවත්පතක පළ කිරීම සඳහා වෙළෙඳ දැන්වීමක් සකස් කරන්න.

- ප්‍රභාවී බතික් රෙදිපිළි නිෂ්පාදකයෝ සහ බෙදාහරින්නෝ, අංක 20, ප්‍රභාස්වර මාවත, සාරගම
- සරම්, කමිස, සාරි, හැට්ට, ගවුම්, මේස රෙදි ආදිය ඉතා ම සාධාරණ මිලට
- වාහන නවතා තැබීමේ පහසුකම් සතියේ සෑම දිනකම පෙ.ව 8.00 සිට රාත්‍රි 8.00 දක්වා වෙළෙඳසැල විවෘතව පවතියි.
- රුපියල් 5000ට වැඩි සෑම බිලකටම 20%ක විශේෂ වට්ටමක්
- සතියේ සෑම දිනක ම පෙ.ව. 8.00 දක්වා වෙළෙඳසැල විවෘතව පවති යි.

(ලකුණු 15 යි)

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

| 21 | S | III |
|---|---|---|

| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II, III |
| சிங்களமொழியும் இலக்கியமும் | I, II III |
| Sinhala Language and Literature | I, II III |

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)

கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)

**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සිංහල භාෂාව හා සාහිත්‍යය III**

**වැදගත්**: උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.

- **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- . මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) වනසිරි පියුම්රා බඳ රනබරණ යුරු...

(අ) ඉහත පද්‍ය පාඨය උපුටා ගත් කෘතියේ කතුවරයා නම් කරන්න.

(ආ) ඒ කතුවරයා රචනා කළ වෙනත් කෘතියක නමක් ලියන්න,

(ii) ගිම්හානයේ ගිලන් වී කෘශව සුදුමැළිව

-----------------------------------------------

දුෂ්කරය කියා හැර යා යුතු ද ජීවිතය

කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස

(අ) මේ පද්‍යයෙහි දෙවන පදය සම්පූර්ණ කරන්න.

(ආ) එම පද්‍ය පන්තියෙහි රචකයාගේ ළමා කෘතියක් නම් කරන්න.

(iii) පහත සඳහන් කෘති රචනා කළ අය කවරහු ද?

(අ) වන සරණ

(ආ) වන සටන

(iv) "ආයි ඇරලා නෑ දෙක ම එක වගේ ම යි"

(අ) මෙහි දෙක ම යනු මොනවා ද?

(ආ) මේ පාඨය උපුටා ගත් කෘතියේ කතුවරයා නම් කරන්න.

(v) "තවත් කාලයක් පෙර සිරිත අනුගමනය කළේ තාත්තා පමණකි"

(අ) මෙහි සඳහන් පෙර සිරිත කුමක් ද?

(ආ) මේ පාඨය ඇතුළත් කෘතිය රචනා කළ රචකයාගේ පළමුවන කෙටිකතා සංග්‍රහය නම් කරන්න.

(vi) "මා ගිය කල ඔහුට සෙත් වෙයි"

(අ) මෙහි මා යනු කවුරු ද?

(ආ) මේ පාඨය ඇතුළත් වන කෘතිය රචනා කිරීමේ බලාපොරොත්තුව කුමක් ද?

(vii) (අ) බැද්දේගම නවකතාවේ මුල් කෘතිය රචනා වූ වර්ෂය නම් කරන්න.

(ආ) "වානරයා" කෘතියේ මුල් කතුවරයා නම් කරන්න.

(viii) යටැසින් ලන බැල්මෙන් සුර විලසී

වෙසෙසින් දන මන මත් කර එක සී

----------------------------------------------------------

දිසි මෙන් විය විදුලිය සිය දහසී

(අ) මේ කවියෙහි තුන්වන පදය සම්පූර්ණ කරන්න.

(ආ) මේ කවිය ඇතුළත් කෘතිය රචනා කිරීමට ආරාධනා කළ අයගේ නම ලියන්න.

(ix) "අපටත් රක්ෂාව නම් උඹ ම වේ ද?"

(අ) මේ පාඨයෙහි සඳහන් උඹ ම යනු කවුරු ද?

(ආ) මේ පාඨය ඇතුළත් වන කෘතියේ මූලාශ්‍රය නම් කරන්න.

(x) නහින දෙහින කාලෙට පින් කෙරුම යුත

වහින කලට කුරින් විල්වලින් එත

බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත

------------------------------------------------------

(අ) මේ කවියේ සිවුවන පදය සම්පූර්ණ කරන්න.

(ආ) ජීවිතයේ විවිධ අවස්ථා අතරින් ජන කවියාට වස්තුවිෂය වූ එක් අවස්ථාවක් ලියන්න.

(ලකුණු 02 x 10= 20 යි)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

(i) "වහන්සෙ, ඇප් උන් වඳම්හ. දුටු කල හුනස්නෙන් නැඟෙම්හ. හිඳුනා අසුන් දෙම්හ. සතර පසයෙන් උපස්ථාන කෙරෙම්හ."

(අ) මේ පාඨයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

(ආ) මේ ප්‍රකාශයෙන් පසු ව සිදුවන්නේ කුමක් ද? කෙටියෙන් දක්වන්න.

(ii) දිමුතු යසස් වන් **කුසුම** **සරාගේ**

නුමුතු සුවඳ මල් පැලඳ **සරාගේ**

දකුතු රඟන සුරඟන රඟ ලාගේ

උමතු නො වෙ ද කෙලෙසක සිත කාගේ

(අ) තද **කළු අකුරින්** මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මේ කවියට අදාළ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) "මැගේ මේ අභිමානය මැට වඩා සම්පත් ඇත්තන් ඇති හෙයින් සම්පතක් නිසාත් නො වෙයි. තමා ජාති සම්පන්න නො වන හෙයින් ජාතියක් නිසාත් නො වෙයි. රූපත් හෙයින් ඒ හා තමා දන්නා ශිල්ප පමණක් නිසා ය."

(අ) මෙහි සඳහන් වන අන්දමට ඇය අභිමානයට පත් වී සිටින්නේ කුමන හේතු නිසා ද?
(ආ) ඇයට අභිමානයට පත් විය නොහැකි හේතු මොනවා ද?

(iv) සේ **රිවි බිම්බා** පතළ තෙද බලැති මහරු
මෙන **රන් වැම්බා** නිසසල ගුණයෙන් සපිරු
මනරම් යුග බා දී අහස ඔසවන යුරු
නෙවිකුම් සිහබා පෙරළුවේය ගල් පුවරු

(අ) අංකිත පදවල අර්ථ ලියන්න.
(ආ) මෙහි ඇති කාව්‍යාලංකාර යෙදුමක් උපුටා දක්වා එය නම් කරන්න.

(v) "මේ මනුෂ්‍ය ලෝකයෙහි උපන් සත්ත්වයන්ගෙන් ජඩ යම් එකක් හු කළ මනා යම් නො කටයුත්තක් ඇත් නම් ඒ සියල්ලෙන් තා විසිනුත් නො කළ මනා දෙයක් ඇත් ද?"

(අ) මේ පාඨයේ අදහස සරල බසින් ලියන්න.
(ආ) මේ ප්‍රකාශය ඇසූ අය ඉන් පසුව කළේ කුමක් ද?

(ලකුණු 04 x 05= 20 යි)

3. උම්මග්ග ජාතකය රසවත් වීමට එහි උපයුක්ත

- කෙටි වැකි භාවිතය හා
- උපමා භාවිතය හේතු වී තිබේ.

එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දෙමින් නිර්දිෂ්ට කොටස ඇසුරෙන් විස්තර කරන්න.

**නැතහොත්**

සැළලිහිණි සන්දේශකරු සිය නිර්මාණයේ අර්ථ රසෝත්පාදනය උදෙසා

- ස්වභාවෝක්ති අලංකාරය ද
- උපමාලංකාරය ද මැනවින් යොදා ගෙන ඇත.

එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දෙමින් නියමිත පාඩම ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15 යි.)

4.

- සජීවී සංවාද යොදා ගැනීමත්
- සංක්ෂිප්ත රචනා රීතියත්

"අමාවතුරේ රසවත් බවට හේතු වී තිබේ". එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දෙමින් "අඟුල්මල් දමනය පාඩම ඇසුරෙන්" විමසන්න.

**නැතහොත්**

වැත්තෑවේ හිමියන් විසින්

- සිද්ධි විස්තර කිරීමේ දී හා
- වර්ණනා කිරීමේ දී අනුගමනය කරන ලද්දේ වෙනස් කාව්‍යෝපක්‍රමයන් ය. නිර්දිෂ්ට පද්‍ය පන්තිය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න

5. විචිත්‍රවත් පාරිසරික සුන්දරත්වයක් මතු කිරීමට "කෑරගලය වැජඹෙයි මේ ලෙසින් සිට" පද්‍ය පන්තිය සමත් වෙයි. උදාහරණ **තුනක්වත්** දෙමින් විමසන්න.

(ලකුණු 10 යි.)

6. අනාගත පරපුර කෙරෙහි සංවේදී දැක්මක් "දෑතේ කර ගැට" පද්‍ය පන්තියෙන් ප්‍රකට වෙයි. උදාහරණ **තුනක්වත්** දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි.)

7. "මුනි සිරිපා සිඹිමින්නේ" පැදි පෙළ රසවත් කිරීමට කවියා උපයුක්ත කොට ගත් කාව්‍යාලංකාර කෙබඳු දැයි උදාහරණ **තුනක්වත්** දෙමින් විමර්ශනය කරන්න.

(ලකුණු 10 යි.)

*****